රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 03/2025

මගේ අංකය : EST-5/04/PCY/0041
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2025.04.07

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## <u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව වැටුප් ගෙවීම</u>

2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය කිරීමට අදාළව නිකුත් කරන ලද 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 කෙරෙහි අවධානය යොමු කරවමි.

02. 2025 අප්‍රේල් මස වැටුප, උක්ත චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ගෙවිය යුතුව ඇත.

03. රජයේ නිලධරයන්ට ගෙවිය යුතු අප්‍රේල් මස වැටුප එම මස 10 වන දින ගෙවීමට කටයුතු කළ යුතු නමුත්, කිසියම් පිළිගත හැකි හේතුවක් මත එදිනට ඉහත සඳහන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සංශෝධිත වැටුප සිය කාර්යමණ්ඩලය සඳහා ගෙවීමට අපොහොසත් වුවහොත්, 2025.04.10 දින ඔවුන්ට දැනට හිමි වැටුප ගෙවිය යුතු අතර නව වැටුප් පරිවර්තන සිදු කිරීමෙන් අනතුරුව අප්‍රේල් මාසය සඳහා ගෙවිය යුතු වැටුපෙහි හිඟ මුදල 2025.04.25 දින ගෙවීමට ක්‍රියාකළ යුතු ය.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011 2 673 330
ෆැක්ස් : 011 2 692 158
විද්‍යුත් ලිපිනය : ade-v@pubad.gov.lk